Page 4 October 2009.qxd 19/10/2009 21:48 Page 1



## 1 වෙනි පිටුවෙන් ......
## මේ කොහි යන්නේ........?

රටේ ප්‍රබුද්ධ අංශවල ක්‍රියාකාරී දක්ෂ පිරිස් සම්බන්ධකරගෙන මෙය කළයුතුය. එසේ නැතිව යන්නන්වාලේ පැලැස්තර දමමින් මේ යන ගමන තවතවත් ප්‍රපාතය කරා යෑමක් පමණි.

### සෞඛ්‍යය

පොදු ජනතාවට තදින්ම බලපාන තවත් වැදගත් අංශයක් වන්නේ සෞඛ්‍ය සේවයයි. දුප්පත්ම ජනතාවට අදත් අන්තිමට පිහිට වෙන්නේ රජයේ රෝහලය. කාලාන්තරයක් තිස්සේ සිටම රජයේ රෝහල් පද්ධතිය මේ සේවාවල් ඉටුකරති. වැඩි වන ඉල්ලුමට අනුව එම අංශවල ව්‍යාප්තිය සහ ගුණාත්මක වර්ධනය තරමක් ඇනහිට තිබේ. දැන් දැන් නව තාක්ෂණික උපකරණ වැඩි වැඩියෙන් සැපයෙන බව පෙනුනද මේවා තව වැඩි කරලීම නුදුරු අනාගතයේදීම අවශ්‍ය වෙනවා ඇත. නැතිනම් වන්නේ අප පුවත්පත් වල ආධාර සඳහා කෙරෙන ආයාචනා වලින් දකින ආකාරයට රුපියල් මිලියන ගණන් වියදම් කොට හදවත් ආදියේ විශේෂ සැත්කම් සඳහා තවමත් ඉන්දියාවේ ඇපලෝ වැනි තැන්වලට රෝගීන් ගෙනයාමය. අප වෛද්‍යවරු මේ සැත්කම් පිළිබඳ දක්ෂයෝ වෙති. ඒ අයට නිසි තාක්ෂණික උපකරණ සපයන්නේ නම් අප රට ඒ වෙනුවට ආසියාවේ හොඳම සැත්කම් මධ්‍යස්ථානයක් බවට පත්කළ හැකි ය.

### රෝග වැළැක්වීමේ සෞඛ්‍ය සේවා (Preventive Health Service)

රටක සෞඛ්‍ය සේවාවන්ගේ ප්‍රධාන අංශ දෙකක් වෙති. එනම් රෝග නිවාරණය (curative) සහ රෝග වැලැක්වීම (preventive) යනුවෙනි.

නිදහස ලද කාලයේ සිටම අප රටේ අවධානය වැඩියෙන් යොමු වූයේ රෝග නිවාරණය සඳහාය. රෝග වැලැක්වීම හැමදාව ලද්දේ කුඩම්මාගේ සැලකිල්ලකි. නමුත් රෝග වලක්වනු ලැබේ නම් රෝග නිවාරණයට යන වියදම බොහොමයක් අඩුකරගත හැකිය. කියුබාව චීනය වැනි සමාජවාදි රටවල එම අංශ ගැන දැඩි අවධානයක් ගැනේ. අධිරාජ්‍යවාදී යුගයේ වුවද සුද්දා වුවද මැලේරියා රෝග මර්දනය ගැන දැඩි අවධානයක් දැක්වීය. එය සාර්ථකව මැඩ පැවැත්වී ය.

දැන් අපේ දොස්තරවරු රෝග වැළැක්වීම ගැන උනන්දු නැත. ඒ රෝග නිවාරණ අංශය ඒ අයට ***ගරානාව*** සඳහා වඩා ලාභදායී නිසා විය හැකිය. එහෙත් වාසනාවට මෙන් රෝග වැලැක්වීම ගැනද අප රටේ වෛද්‍ය පර්යේෂණ ආයතන වැනි තැන්වල විශේෂඥතා ලද වෛද්‍ය වරුන් සිටින බව පසුගිය සමයේ ඩෙංගු උණ ගැන පළවූ ලිපි හා වාර්තා වලින් ඔප්පු වේ.

පසුගිය කාලයේ දිගටම රටේ ඩෙංගු උණ බෝවෙමින් පැවතිණ. 2009 අගෝස්තුවේ අප රටේ 26000 කට අධික පිරිසකට රෝගය බෝවී තිබුණු අතර 260 කට අධික සංඛ්‍යාවක් මිය ගිය බව වාර්තා විය. දීර්ගකාලයක් රෝගය බෝවෙමින් පැවති අතර හැම සතියකම වැඩි වැඩියෙන් මියගියේය. වෙන රටක නම් මෙවැනි තත්වයක් මතුවන විට සෞඛ්‍ය හා අදාල බල ධාරීහු හදිසි පියවර ගෙන වහා වැඩට බසිති. අප රටේ සිදුවූයේ මදුරුවන් බෝවන දිය කඩිති තිබුණහොත් ඒ ඉඩම අයිතිකාරයාට නඩුදාන නීති රීති පැණවීම පමණකි. ඒ දිනවල සොයා බැලූවිට දැනගන්නට ලැබුණේ ලංකාවේ සෞඛ්‍ය ඇමතිවරයා සිය බල ප්‍රදේශය වන ඌව පළාතට වී පැල් බැඳගෙන ඡන්ද වැඩ කරන බවය.

දැන් නියං සමයත් සමග වැසි අඩු බැවින් ඩෙංගු මදුරුවන් බෝවීම අඩුවූ නිසාදෝ රෝගය බෝවීම අඩුවී ඇත. යළිත් නොවැම්බරයේ වැසි ඒමත් සමග නැවත වැඩිවනු නියතය. ඩෙංගු මදුරුවන් විනාශකර දමා එම රෝගය සාර්ථක ලෙස මර්දනය කර ඇති කියුබාව අප රටට ඒ පිලිබඳව විශේෂඥ උපදෙස් පිරිස් සහ බෙහෙත් වර්ග දීමට සූදානම්බව විටින්විට පළවිය. එහෙත් ඒ පිළිබඳ කිසි උනන්දුවීමක් අපේ සෞඛ්‍ය අමාත්‍යංශයෙන් නොපෙනේ. ඒවාට සම්බන්ධ ලොකු කොමිස් කොන්ත්‍රාත්තු නැති නිසාද?

පෙර කාලයේ මෙවැනි රෝග මර්දන සේවාවන් සඳහා මහජන සෞඛ්‍ය නිලධාරීහු ක්‍රියාකාරීව සිටියහ. ඔවුහු ගමින් ගමට ගොස් ජනතාවගේ සෞඛ්‍යය ගැන සොයා බැලූහ. දැන් එවැනි අය ඉන්නවාද කියාවත් නොදැනේ. ඉතින් රෝග වැළැක්වීම ගැන කවර කතාද?

සංචාරක ව්‍යාපාරය වනාහි ස්වාභාවික දිවයිනක් වූ අප රටට ආදායමක් ලැබෙන එක් මාර්ගයකි. ශ්‍රීලංකාව බලාපොරොත්තු වන්නේ පෙරදිග පාරාදීසය ලෙස ඒවෙතට සංචාරකයින් ඇදගන්නටය. දර්ශනීය ලක්ෂරි හෝටල් නිවාඩු නිකේතන තනා ප්‍රචාරක වැඩ සඳහා ලක්ෂ ගණනින් වියදම් කරති. එහෙත් ඩෙංගු මැලේරියා ආදී වසංගත රෝග ගහණ රටකට සංචාරක යින් ඒ ද? ලංකා රජය මේ කිසිවක් ගැන බිඳක්වත් කල්පනාවට ගෙන නැත..

### පොලිසියේ අව කල්ක්‍රියා

ශ්‍රීලංකා පොලීසියේ නින්දා සහගත හැසිරීම රටේ ජනතාවට ඉමහත් හිරිහැරයක්ව ඇති බව ප්‍රකට කරුණකි. යුද සමයේ රණවිරුවන් යයි ජනතාවගෙන් ප්‍රශංසා ලැබූ පොලීසියට යුද්ධය අවසන්ව මාස පහක් ගිය තැන ඒ ජනතාවම සාප කරන තත්වයකට පත්ව ඇත. ජනතාවට පහරදීම් වෙඩිතබා මැරීම් ආදී දේ ජනතාව ආරක්ෂාකිරීමටය කියා සිටිනා පොලීසියෙන් සිදුවීමත් එවැනි පොලීසියක් හසුරුවන්නට බැරි රජයක ක්‍රියාකලාපයත් කෙරෙහි ජනතා කල කිරීම හා කෝපය එල්ලවීමත් වැලැක්විය නොහැකිය. එහෙත් රජය ඒ ගැන තකන බවක් වත් පොලීසිය මට්ටුකරන බවක් වත් නොපෙනේ.

### මැති ඇමතිවරුන්ගේ හැසිරීම හා රටේ මුදල් නාස්තිය

වර්තමාන ශ්‍රීලංකා රජයේ මැති ඇමතිවරු රටේ මුදල් යොදවමින් පවුල් පිටින් නිතර පිටරට සංචාරයේ යෙදෙන හැටි ඒ වියහියදම් විස්තර සහිතව පුවත්පත් වල පළවී තිබෙනු නිතර දක්නට ලැබේ. එක් ඇමතිවරයෙක් තම දියණියගේ උපන්දින සාදය පැවැත්වූයේ ඇමරිකාවේ ප්‍රධාන පෙළේ හෝටලයකය. රුපියල් විසිතිස් ලක්ෂයක ඒ වියදම් ඔහු ශ්‍රීලංකා රජයට බැරකළ බව හෙළිවිය. තඹ සතේක ප්‍රයෝජන වත් වැඩක් නොකරන බොහෝ මැති, ඇමති, උපඇමතිවරුන් සඳහා නිත්‍ය ආරක්ෂාව සපයන්නටද, ඒ කායිසියාල, මන්දිර, සේවක සේවිකාවන් නඩත්තු කරන්නටද වැයවන මුදල් කන්දරාව දෙස බලන විට මැදපෙරදිග දහදුක් විඳ අපේ කාන්තාවන් උපයා එවන විදේශ විනිමය මුදල් වලට වන්නේ කුමක්දැයි සිතාගත හැකිය.

### සරණාගත ප්‍රශ්නය / දකුණේ ඡන්දය

උතුරු නැගෙණහිර කඳවුරුවල අවතැන්වූ දෙමළ සහ මුස්ලිම් ජනයා ලක්ෂතුනක් සිටිති. ඒ අයගේ සෞඛ්‍ය පහසුකම් හා නිදහස් චලනය සම්බන්ධව නොයෙක් අඳෝනා හා අවලාද දොස් පරොස් එම කඳවුරු ඇතුළතින්ද, ලංකාවේත් පිටරටවලත් සිටින දෙමළ ජනයාගෙන්ද, යුරෝපීය රටවල් වලින්ද නොකඩවා එයි. ශ්‍රීලංකාව මිනිස් අයිතිවාසිකම් කඩකිරීම ගැන චෝදනා කරන බටහිර රටවල් ශ්‍රීලංකාව යුද අධිකරණය වෙත ගෙනයාමට අර අඳින හැටිද පෙනේ. ප්‍රධාන විදේශ රටවල් කීපයකම වෙසෙන දෙමළ ඩයස්පෝරාව හා තමිල්නාඩුව මහන්සි ගන්නේ ඊළම් යුද්ධය යළි අවුලවා ගැන්ම සඳහාය. මේ සියළු දේ කල්පනාවට ගෙන බැලුවොත් ශ්‍රීලංකාව පත්ව ඇති තත්වය එතරම් සතුටුදායක නැත.

මේ අවදානම් තත්වය කොයි අතට හැරේදැයි කිව නොහැකිය. ජාත්‍යන්තර මණ්ඩප යේ අපට පක්ෂව රටවල් කීපයක් සිටින බව සැබෑ නමුත් ඔවුන් හැමදාම අපේ ආරක්ෂාවට සිටීයයි කුමන සහතිකයක්ද? පිටතින් ජාත්‍යන්තරව එන චෝදනා නිශ්ප්‍රභා කරන්නට හැකි වාදයට දක්ෂ නිළධාරීන් තෝරා විදේශ දූත මෙහෙවරට යැවීමත් දක්ෂ විදේශීය ප්‍රචාරක සමාගමක් කුලියට ගෙන ඒ කටයුතු පැවරීමටත් සුදුසු බව බොහෝවිට යෝජනා වුවද ඒ ගැන රජය සැලකිල්ලක් ගෙන නැත. ඇමතිවරුන් නැති නාස්ති කරන මුදල්වලින් ඒ කටයුතු අගේට පියවා ගත හැකි ය.

මේ සියල්ල මෙසේ වෙද්දී රජය දකුණු පළාතේ ඡන්ද වැඩට බැස සිටී. එය දැනටම විගඩමක් බවටත්, ජනතාවගේ අප්‍රසාදයටත් හේතුවී ඇත. පැරණි ආකාරයටම ආණ්ඩු පක්ෂයේ අයම එකිනෙකා ගහ බැණගැනීම්, රථවාහන කුඩුකිරීම්, අසභ්‍ය පෝස්ටර් ගැසීම්, මැරවරයින්ගේ හැසිරීම් ආදියෙහි අඩුවක් නැතුව සිදුවෙමින් එම ඡන්දය සිය පාක්ෂිකයන් අතරම යුද්ධයක් බවට පෙරළී ඇත. ජනාධිපතිවරයාට වත් මෙල්ල කළ නොහැකි තත්වයක පක්ෂය තුළ පවතින බව බොහෝ දෙනා දැන් කියති.

යුද්ධයක් දිනා පස්මාසයක් යන්නටත් පෙර වගකිව යුතු රජයක අමන හැසිරීම් දෙස බලා ජනතාව කළකිරීමට පත්වන්නේ නම් ඒ කළකිරීම සාධාරණය. ඒ යුද්ධය දිනුවේ නිකම්ම නොව ඒ ජනතාවගේ ආදරණීයයන්ගේ ජීවිත දහස් ගණනක් මව්බිම වෙනුවෙන් පරිත්‍යාග කිරීමෙන් පසුවය. එහෙත් රට කරවන්නන්ගේ වගකීමෙන් තොර මුඨ ගොන් හැසිරීමට රටේ මිනිසුන්නේ අනුමැතිය කිසිසේත් නොලැබේ.


අපේ රට පොහොසත් රටක් නොවේ. යළිත් යුද්ධ කරන්නට අපට වත්කමක් නැත. හැමදාම යුද්ධයේ යෙදී සිටින රටවල් අගාධයට මිස කිසි දින සෞභාග්‍යය කරා යන්නේවත් දියුණුවක් ලබන්නේවත් නැත. ශ්‍රීලංකාව ඒ තත්වයට වැටිය යුතු නොවේ. අප රටේ බහුතර ජනයා බුද්ධිමත්ය. හික්මීම ඇති සංවරකමින් පිරුණු අයය. පාලනය කළ හැකි එවැනි මිනිසුන් ඇති රටක් රුවිතෙට යන්නේ එහි පාලකයන්ගේ වරදිනි. “ මේ කොයි යන්නේ ” දැයි අප අසන්නේ රට දැන් යන අත අපට හොඳින් පෙනෙන නිසාය.

# අකාලයේ දැයෙන් සමුගත් යහපත් රාජ්‍ය තාන්ත්‍රිකයා





ගරු ගාමිණි දිසානායක මැතිතුමා *Hon. Gamini Dissanayake*



***ගාමිණි දිසානායක මහතා බ්‍රිතාන්‍යයට පැමිණි අවස්ථාවක එවකට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ කතානායකවරියව සිටි බෙටි බූත්රොයිඩ් මහත්මිය සමග***

ශ්‍රීලංකාවේ නම කී පමණින් ලොව බොහෝ දෙනෙකුට සිහිපත් කරන්නේ ක්‍රිකට්ය. ඔවුන් ශ්‍රීලාංකික ක්‍රිකට් ක්‍රීඩකයින් ගැන දැඩි ඇල් මකින් යුතුව කතාකරති. ශ්‍රීලාංකීය ක්‍රිකට් ක්‍රීඩා ක්ෂේත්‍රය ජාත්‍යන්තර මට්ටමකට ගෙන ඒමටත්, ජගත් ක්‍රිකට් ශූරතා හා වාර්තා දිනා ගැනීමටත් මංපෙත් එළිපෙහෙළි කළ මාර්ගෝපදේශකයා ගාමිණී දිසානායක මහතා ය. 1980 දශකයේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිව සිටි එතුමා කොටි ත්‍රස්තවාදී ග්‍රහණයට ලක්ව මරුමුවට පත්ව මෙම ඔක්තෝබර් 24 වන දිනට 15 වසරකි ක් සම්පූර්ණ වෙයි.

ගාමිණී දිසානායක ශ්‍රීලාංකික ඕනෑම තරාතිරමක සමාජයක පුද්ගලයෙකුට හඳුන් වාදීමට අටුවා ටීකා අවශ්‍ය නැත. නීතිඥවරයෙකු, ලෙස පම ණක් නොව 1994 ජනාධිපති අපේක්ෂක යෙකු ලෙස ද ජනනායකයෙකු වූ මෙතුමා ජාතියේ පිනට පහළව ජාතියේ අවාසනාවට අහිමි වූ චරිතයකි.

1981 දී ශ්‍රීලංකාවට ටෙස්ට් ක්‍රිකට් වරම් ලබාගැන්ම සඳහා එතුමා ජගත් ක්‍රිකට් කවුන්සලය ඇමතූ ආකර්ශණීය වාග් විලාශය ඉදිරිපත් කිරීම සම්පත්දායක යෝජනාවලට බලධරයෝ වශී වූහ. අපේ ක්‍රිකට් ක්‍රීඩාව කොළඹින් බැහැර ජනප්‍රිය කරවීමටත්, සමස්ත ශ්‍රීලංකාවම ක්‍රිකට් කෙරෙහි ඇද බැඳ තැබීමටත් දිසානායක මහතා කළ මෙහෙය අපූරුය. 1996 ලෝක ශූරතාව දිනූ ක්‍රිකට් කණ්ඩායම ශ්‍රීලංකාවට පා තැබූ පසු දිනම ඒ දිනූ කුසලානද රැගෙන ගාමිණී පදිංචි නිවසට ගොස් ඒ පවුලේ අය වෙත ගාමිණී දිසානායක පිළිබඳ මතකය හා ගෞරවය මෙනෙහි කළෝය.

ක්‍රිකට් පමණක් නොව ශ්‍රීලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නව නැම්මක් ඇති කිරීමට එතුමෝ පුරෝගාමී වූහ. මහවැලිය කී පමණින් ශ්‍රීලාංකිකයින් සිහියට නගන්නේ ගාමිණී දිසානායකය. වසර 30 කින් නිම කිරීමට සැළසුම් කළ මහවැලි සංවර්ධන ව්‍යාපාරය වසර 6 කින් නිම කිරීමේ අභියෝගය භාරවූයේ දිසානායක මහතාටය. මෙගා වොට් 740 ක ධාරිතාව කින් යුතු විදුලි බලාගාර 6ක් ද, වික්ටෝරියා, රන්දෙනිගල, කොත්මලේ, මාදුරු ඔයවැනි වාරි මාර්ග ව්‍යාපෘති ගොඩ නැගුණේ මෙතුමාගේ මගපෙන්වීම යටතේය.

නව ජනාවාස බිහි කිරීම, ගොවිපවුල් පදිංචිකිරීම වැනි කටයුතු වලදී ගැමි සංස්කෘතික ලක්ෂණ හා සම්ප්‍රදායන් ඒසැටියෙන්ම ආරක්ෂා කිරීමට එතුමා කටයුතු යෙදීය. මහවැලි ක්‍රීඩා, මහවැලි සංස්කෘතික සංදර්ශන, මහවැලි පාසැල්, මහවැලි මධ්‍යස්ථාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ බිහිවූයේ එසේය. මේසා විශාල කායිභාරයක් ඉටුකිරීමට තිබූ බාධක ජයගැන්ම මෙතුමාගේ විශේෂයකි. ස්වීඩනය, බ්‍රිතාන්‍යය, ජපානය, ඕස්ට්‍රේලියාව, ජර්මණිය, ඉන්දියාව වැනි රාජ්‍ය සමග සමීප සම්බන්ධතා ද ඇතිකරගැන්මට එතුමෝ සමත්වූහ.

ගාමිණී දිසානායක දේශපාලන ක්ෂේත්‍රයේ පෙරළිකාරයෙකි. උතුරු නැගණහිර මායිම් ගම්මාන වලින් සිංහළ ගොවි ජනතාව එළවාදැමීමේ ප්‍රයත්නයට විරෝධය පැවා පමණක් නොව එය මගහැරවීමටද පියවර ගත්තේය. 1991 දී ප්‍රේමදාස ජනාධිපතිවරයාට එරෙහිව ගෙන ආ දෝෂාභියෝග යෝජනාව නිසා දේශපාලන ක්ෂේත්‍රයේ කැළඹීමක් ඇති කරවීමේ නව මංපෙත් හෙළිකරවීය. ගාමිණී දිසානායකගේ දේශපාලන සගයන්වූ ආචාර්ය සරත් අමුණුගම, කෙහෙළිය රඹුක්වැල්ල, වී පුත්‍ර සිහාමනි, මහින්ද යාපා අබේවර් ධන යන අය වත්මන් රජයේ ප්‍රබලයෝ වෙති. මෙතුමා ගේ සමීපතම නිලධාරීන් වශයෙන් කටයුතු කළ බැසිල් රාජ පක්ෂ, ලක්ෂමන් හුළුගල්ල දේශපාලනයේ කැපී පෙනෙන චරිතය.

1942 මාර්තු 20 දින කොත්මලේ ඉපිද මහනුවර දීප්තිමත් ශිෂ්‍යයෙකු වශයෙන් ත්‍රිත්ව විද්‍යාලයෙන් සිප්සතර හදාරා දීර්ඝ දේශපාලන ගමනක යෙදුණු ගාමිණී දිසානායක මහතා විනාශකර දැමීමට අවශ්‍යවුණේ කුරිරු ත්‍රස්තවාදීන්ට පමණි. මෙතුමා නිතර පොතපත පරිශීලනය කළේය. පාර්ලිමේන්තුව තුළ කළ දේශන හරබරය, රසවත්ය.

ගම්බද ළමයින්ට ඉංග්‍රීසි භාෂාව හා පරිගණක විද්‍යාව ඉගැන්වීමට මෙතුමෝ කටයුතු කළහ. එම කටයුතු එතුමාගේ බිරිඳ ශ්‍රීමා දිසානායක, පුතනුවරුන් වන නවීන් සහ මයන්ත මෙන්ම, එකම දියණිය වරුණී වෙතින්ද ඉටුවෙමින් පවතී. ගාමිණී දිසානායක පදනම පිහිටුවා එතුමාගේ නමින් කරන යුග මෙහෙවර මිළකළ නොහැක. අදටත් ශ්‍රීලංකාවේ කොයි කාගෙත් මතකයට නැගෙන මෙහෙවර දාමයක පුරෝගාමීවූ අභාවප්‍රාප්ත ගාමිණී දිසානායක මැතිඳුන්ට ගෞරව ආචාරය පුදකරමු.

*ශ්‍රීලංකා පාර්ලිමේන්තුමේ*
*හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී*
*♦ මේජර් වී. බී. කරුණාරත්න*
**Oxford UK**